# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දේශීය ආදායම් (සංශෝධන)

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2015 සැප්තැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 මාර්තු මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[1 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 31.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 30.00 යි.**

2—PL 009230—475 (2015/09)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකා දියවැඩියා සංගමය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම සහ එම වගන්තියේ ඇති වරදක් නිවැරදි කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ සේවායෝජකයන් විසින් සේවා නියුක්තයන්ට සපයනු ලබන ණය මුදලකින් ලැබෙන ප්‍රතිලාභය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, අවුරුදු 60 ක් සහ ඊට වැඩි පුද්ගලයන්ගේ පොලී ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අපනයනය කිරීම සඳහා නිෂ්පාදන නිපදවීම සඳහා වූ නව ව්‍යවසායක් විසින් ගෙවනු ලබන ලාභාංශවලට ද ආදායම් බදු නිදහස ව්‍යාප්ත කිරීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) ජාත්‍යන්තර චිත්‍රපට හා නාට්‍ය උළෙලවල දී සම්මාන ලබන චිත්‍රපටි හා නාට්‍යවලට අනුග්‍රහ ලබා දීම;

(ආ) ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ හෝ ව්‍යාපාර ක්‍රියාවලීන් බහිර් අර්පණය කරන සමාගම්වලින් රාජ්‍ය භාගය වශයෙන් ලැබෙන ලාභ, ආදායම් බද්දෙන් නිදහස් කිරීම; සහ

(ඇ) විදේශීය කොටස් හුවමාරුවල ලියාපදිංචි කර ඇති ඇමරිකානු ඩොලර් තැන්පතුවලින් හෝ ඇමරිකානු ඩොලර්වලින් වටිනාකම නියම කර ඇති සුරැකුම්පත්වලින් ඒකක භාරවලට ලැබෙන ලාභය ආදායම් බද්දෙන් නිදහස් කිරීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ,

(අ) එම වගන්තියේ ඇති ඇතැම් වැරදි නිවැරදි කිරීම;
(ආ) අපනයන සඳහා වූ නිෂ්පාදන සමාගම්වල ආයෝජනය කිරීමට අනුග්‍රහ ලබා දීම;
(ඇ) නවෝත්පාදන සඳහා හෝ ඉහළ වටිනාකමක් සහිත කෘෂිකාර්මික නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ සඳහා අනුග්‍රහ ලබා දීම;
(ඈ) සම්මත නිපුණතා සංවර්ධන පුහුණුකිරීම් සඳහා අනුග්‍රහ ලබා දීම;
(ඉ) නිෂ්පාදන අපනයනය කිරීම සඳහා වෙළඳ නාම ප්‍රවර්ධනය සඳහා අනුග්‍රහ ලබා දීම වේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ජාතිය ගොඩනැගීමේ බද්ද, සුපිරි ලාභ බද්ද සහ මුදල් පනත යටතේ පනවනු ලබන වෙනත් බදු අඩු කිරීමට ඉඩ ලබා නොදීම වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) ඒ වගන්තියේ ඇතැම් වැරදි නිවැරදි කිරීම;

(ආ) බැංකුවක්, මූල්‍ය ආයතනයක් හෝ කල්බදු සමාගමක් බද්ධ කිරීමෙන්, අත්කර ගැනීමෙන් හෝ ඒකාබද්ධ කිරීමෙන් පසු ඒවායේ අලාභය ඉදිරියට ගෙනයාම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) සුදුසුකම් ලැබීමේ ගෙවීම සඳහා අඩු කිරීම, ජාතික වකුගඩු අරමුදලට ද අදාළ කර ගැනීම;

(ආ) ඒ වගන්තියේ ඇති වරදක් නිවැරදි කිරීම;

(ඇ) බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් ඒකාබද්ධ කිරීමේ දී දරනු ලබන වියදම් අඩු කිරීම සඳහා ඉඩ ලබා දීම වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, එම වගන්තියේ ඇති ඇතැම් වැරදි නිවැරදි කිරීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, සහන අදාළ වීම සීමාකිරීම වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, සේවා නියුක්තයන්ට සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම මත සහනදායී බදු අනුප්‍රමාණයක් ලබා දීම වේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, සීනි නිෂ්පාදනය සඳහා වන ව්‍යවසායක් සඳහා සහනදායී බදු අනුප්‍රමාණයක් ලබා දීම වේ.

***15 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 14 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***16 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 48ඇ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම අලුත් වගන්තිය මගින් ආයෝජන මණ්ඩල සමාගම් විසින් ආයෝජන නිර්ණායක සපුරාලිය යුතු කාල සීමාව දීර්ඝ කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

***17 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 56ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, බදු සහනය අදාළ වීම ඇසුරුම් ද්‍රව්‍යවලට සහ සෙරමික් නිෂ්පාදනවලට ද ව්‍යාප්ත කිරීම වේ.

***18 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, භාණ්ඩ අපනයනය කිරීමේ දී සේවා සපයන භාණ්ඩ මෙහෙයවන්නන්ට සහනදායී බදු අනුප්‍රමාණයක් ලබා දීම වේ.

***19 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, වෙනත් සමාගම් වලට ද එම බදු සහනය ව්‍යාප්ත කිරීම වේ.

***20 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඊ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ඒ වගන්තියේ කාර්යය සඳහා බදු ගණනය කිරීමේ ආකාරය තවදුරටත් පැහැදිලි  කිරීම වේ.

***21 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 59එ, 59ඒ, 59ඔ, 59ඕ සහ 59ක යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිවල නීතියේ බලපෑම වනුයේ -

(අ) නිෂ්පාදන සමාගම් පුළුල් කිරීම සඳහා සහනදායී බදු අනුප්‍රමාණයක් ලබා දීම;
(ආ) අවුරුදු 6ක කාලයක් සඳහා නව නිෂ්පාදන සමාගම් සඳහා සහනදායී බදු අනුප්‍රමාණයක් ලබා දීම;
(ඇ) 1970 සිට ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින දේශීය නිෂ්පාදකයන්ට සහන ලබා දීම;
(ඈ) අතුරු බෝග වගා කටයුතු සහ ආහාර පිරිසැකසුම් කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සහන ලබා දීම;
(ඉ) යම් පසුගාමී කලාපයක පිහිටි ව්‍යවසායක් සඳහා සහන ලබා  දීම වේ.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය පැහැදිලි කරනු ලැබේ.

***23 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පැහැදිලි කරනු ලැබේ.

***24 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, තාක්ෂණික සේවා සඳහා ගාස්තු, ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබීම ය.

***25 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 24 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***26 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 105අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම නව වගන්තිය මගින් පනතේ කාර්ය සඳහා විද්‍යුත් සන්නිවේදන සහ විද්‍යුත් වාර්තා භාවිතා කිරීම සඳහා විධිවිධාන සළස්වනු ලැබේ.

***27 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, එම වගන්තියේ වරදක් නිවැරදි කිරීම වේ.

***28 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ සාමාජිකයකු ද ඇතුළත් කිරීම මගින් ''අනුමත ගණකාධිකාරීවරයා,'' යන වචනයේ අර්ථ නිරූපණය පුළුල් කරනු ලැබේ.

***29 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, සේවා නියුක්තයන්ගේ පෞද්ගලික දීමනාව රුපියල් හත්ලක්ෂ පනස් දහස දක්වා වැඩි කිරීම වේ.

***30 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, එම වගන්තියේ ඇති ඇතැම් වැරදි නිවැරදි කිරීම වේ.

***31 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 9 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***32 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් එම වගන්තිය තවදුරටත් පැහැදිලි කරනු ලැබේ.

***33 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ඒ වගන්තිය යටතේ ත්‍රෛමාසික පදනමක් මත බැංකු සහ මූල්‍ය ආයතන විසින් වාර්තා ඉදිරිපත් කිරීමට හැකියාව ලබා දීම වේ.

***34 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, එම වගන්තිය යටතේ ත්‍රෛමාසික පදනමක් මත වාර්තා ඉදිරිපත් කිරීමට හැකියාව ලබා දීම වේ.

***35 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් එම වගන්තිය තවදුරටත් පැහැදිළි කරනු ලැබේ.

***36 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, බැංකු සහ මූල්‍ය ආයතන සහ කල්බදු සමාගම් බද්ධ කිරීමෙන් හෝ ඒකාබද්ධ කිරීමෙන් පසු බදු ගණනය කිරීම සඳහා සහ පනතේ කාර්යය සඳහා විද්‍යුත් සන්නිවේදන සහ විද්‍යුත් වාර්තා භාවිතා කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා නියෝග සෑදීමට විධිවිධාන සැලැස්වීම වේ.

***37 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එමගින් එම උපලේඛනයේ ඇති ඇතැම් වැරදි නිවැරදි කරනු ලැබේ.

***38 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එය 20 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***39 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් 2015 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත සඳහා කථානායකවරයාගේ සහතිකය සටහන් කරන දිනයෙන් අවසන් වන කාලය තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් අය කර එකතු කරන ලද බදුවලට වලංගුභාවය දෙනු ලැබේ.

# දේශීය ආදායම් (සංශෝධන)

**එල්. ඩී.— ඕ. 11/2015**

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2015 අංක      දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, එය 2015 අප්‍රේල් මස 1 වන දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**2.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය, එහි (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (xvii) වන අනුඡේදයේ "2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් හෝ 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2008 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (lxxii) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයේ; සහ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ ඡේදයේ (lxxiii) වන අනුඡේදයේ "අනුස්මරණ අරමුදලේ," යන වචන වෙනුවට "අනුස්මරණ අරමුදලේ; සහ'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ ඡේදයේ (lxxiii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:–

2– PL 008996-475 (2015/04)

"(lxxiv) 1992 අංක 1 දරන ශ්‍රී ලංකා දියවැඩියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා දියවැඩියා සංගමයේ, ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**3.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (ඛ) ඡේදයේ, "අටදහසක් නොඉක්මවන ලාභ සහ ආදායම." යන වචන වෙනුවට "අටදහසක් නොඉක්මවන ලාභ සහ ආදායම; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඛ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ම) ණයදීමේ කාර්යය සඳහා ණයට ගනු ලැබූ අරමුදල්වලින් දෙනු ලබන ණයක් නොවේ නම්, සේවා යෝජකයා විසින් පොලී රහිතව හෝ සහනදායී පොලී අනුපාතිකයක් මත යම් ණයක් දීමෙන් ලැබෙන ප්‍රතිලාභය,".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**4.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (උෟ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (උෟ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:–

"(ඏ)(ඏ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ද, ශ්‍රී ලංකාවේ වාසිකයකු වූ ද හා 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2015 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදය තුළ වයස අවුරුදු හැට එළඹෙන්නා වූ හෝ 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු වන දිනයේ දී වයස අවුරුදු පනස් නවයක් ඉක්මවා ඇත්තා වූ ද යම් පුද්ගලයකුට, මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දී ඇති යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක පවත්වා ගෙන යනු ලබන යම් තැන්පතුවකින් 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව 2015 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා හෝ 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උපචිත වන හෝ උද්ගත වන පොලියේ කොටස;

(ඏඏඏ) යම් පුද්ගලයකු හෝ පුණ්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන එක් ඉතිරි කිරීමේ ගිණුමක් හෝ ඊට වැඩි ඉතිරි කිරීමේ ගිණුම් සංඛ්‍යාවක් වෙනුවෙන් එක් මාසයක් සඳහා ගෙවනු ලබන පොළිය රුපියල් පන්දහසකට අඩුවන අවස්ථාවක, ඒ පුද්ගලයාට හෝ පුණ්‍ය ආයතනයට 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උපචිත වන හෝ උද්ගත වන පොලියේ කොටස,

මේ ඡේදයේ කාර්යය සඳහා "ඉතිරි කිරීමේ ගිණුම" යන්නෙන් ඒ ගිණුමෙන් මුදල් ආපසු ගැනීමේ අයිතිය කෙරෙහි බලපාන යම් කොන්දේසියකට යටත් වන හෝ යටත් නොවන සහ ඒ මුදල් තැන්පතුව පවත්වාගෙන යනු ලබන කාලසීමාව මත ගෙවනු ලබන පොලී අනුපාතය තීරණය නොවන ගිණුමක් අදහස් වේ."; සහ

(3) ඒ වගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:–

"(ජ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් සාංගමික ණය සුරැකුම්පතක, 2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් යම් තැනැත්තකුට උපචිත වන හෝ උද්ගත වන පොලිය හෝ වට්ටම;සහ

(ට) ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ජාතික සංවර්ධන බැඳුම්කරවල 2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් විදේශ රටක ජීවත්වන හෝ විදේශ රටක සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයකු වන යම් තැනැත්තකුට උපචිත වන හෝ උද්ගත වන පොලිය,"

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ "මාස තුනක් ඇතුළත නම්," යන වචන වෙනුවට "මාස තුනක් ඇතුළත නම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ක) පවත්නා ව්‍යාපාරයක් කැඩීමෙන් හෝ ප්‍රතිනිර්මාණය කිරීමෙන් පිහිටුවනු නොලැබුවා වූ ද, අපනයනය කිරීම සඳහා නිෂ්පාදන නිපදවීම සඳහා, ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන දෙකකට (හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට) නොඅඩු ආයෝජනයක් සහිතව 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ කරනු ලැබුවා වූ ද, 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ පළමු වන අතුරුවිධානයේ (ඌ) ඡේදය යටතේ ක්ෂයවීමේ දීමනාව සඳහා හිමිකම් ලබන්නා වූ ද යම් අලුත් ව්‍යවසායක් විසින් ඒ ව්‍යවසායේ යම් කොටස් හිමියකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්, ඒ ව්‍යවසාය වාණිජ කටයුතු ආරම්භ කරන තක්සේරු වර්ෂයේ සිට ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තවත් තක්සේරු වර්ෂ හතරක කාලපරිච්ඡේදය තුළ ඒ අලුත් ව්‍යවසායේ ලාභ සහ ආදායමෙන් ගෙවනු ලබන අවස්ථාවක, ඒ ලාභාංශය,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (ටටටට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ටටටටට) අන්තර්ජාතික චිත්‍රපට හෝ නාට්‍ය උළෙලක දී සම්මානලාභී චිත්‍රපටයක් හෝ නාට්‍යයක් නිෂ්පාදනය කරනු ලබන යම් පුද්ගලයකුට, ඒ සම්මානය හිමි වූ වර්ෂයේ සිට ආරම්භ වන තක්සේරු වර්ෂ පහක කාලයක් සඳහා, චිත්‍රපට හෝ නාට්‍ය නිෂ්පාදනය කිරීමෙන් 2015 අප්‍රේල්

මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලපරිච්ඡේදයක් සඳහා ලැබෙන ලාභ සහ ආදායමෙන් හරි අඩක්;";

(2) ඒ වගන්තියේ (තත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(තතත) යම් විදේශීය කොටස් හුවමාරුවක ලැයිස්තුගත ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් තැන්පතුවල හෝ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් වටිනාකම නියම කර ඇති සුරැකුම්පත්වල 2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරනු ලබන ආයෝජනයකින් යම් ඒකක භාරයකට උද්ගතවන හෝ උපචිත වන ලාභ සහ ආදායම;";සහ

(3) ඒ වගන්තියේ (මමමමමමමම) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(මමමමමමමමම) ශ්‍රී ලංකාවේ යම් තොරතුරු තාක්ෂණ සමාගමක හෝ ව්‍යාපාරික ක්‍රියාවලීන් බහිර් අර්පණය කරනු ලබන සමාගමක විශේෂිත අවශ්‍යතාවක් ලෙස, ශ්‍රී ලංකාවේ පිහිටි ඒ සමාගමේ ඒ වාණිජ කටයුතු ආරම්භ කරන ලද තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තවත් එක් තක්සේරු වර්ෂයක් සඳහා රාජ්‍ය භාගයක් වශයෙන් කරනු ලබන යම් ගෙවීමකින් ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා උද්ගත වන හෝ උපචිතවන ලාභ සහ ආදායම;".

**7.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ, 1 වන උපවගන්තියේ–

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (v) වන අනුඡේදය සහ (vi) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:–

"(v) ඉදිකරන ලද යම් සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ලක්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබුවා වූ ද, වාණිජ ඒකකයක් ලෙස භාවිතා කිරීම සඳහා ඉදිකරන ලදුව අත්කර ගත්තා වූ ද, සහාධිපත්‍ය දේපළකට යම් ඒකකයක් හෝ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා එම ගොඩනැගිල්ල භාවිතා කර තිබුණු තැනැත්තකුගෙන් අත්කර ගත් යම් (හෝටල් ගොඩනැගිලි සංකීර්ණයක් ඇතුළුව) හෝටල් ගොඩනැගිල්ලක් හෝ (කාර්මික ගොඩනැගිලි සංකීර්ණයක් ඇතුළුව) යම් කාර්මික ගොඩනැගිල්ලක් -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, ඒ ගොඩනැගිල්ලේ හෝ ඒකකයේ ඉදිකිරීමේ වියදම මත හෝ අත්කර ගැනීමේ වියදම මත වර්ෂයකට සියයට හයයි තුනෙන් දෙකක අනුප්‍රමාණයට; හෝ

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, ඒ ගොඩනැගිල්ලේ හෝ ඒකකයේ ඉදිකිරීමේ වියදම මත හෝ අත්කර ගැනීමේ වියදම මත, වර්ෂයකට සියයට දහයක අනුප්‍රමාණයට;";

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ඌ) අපනයනය කිරීම සඳහා නිෂ්පාදන නිපදවීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන දෙකකට හෝ වෙනත් ව්‍යවහාර මුදල් ඒකකයකින් ඊට සමාන මුදලකට නොඅඩු ආයෝජනයක් සහිතව 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ කළා වූ ද, පවත්නා ව්‍යවසායක් කැඩීමෙන් හෝ ප්‍රතිනිර්මාණය කිරීමෙන් පිහිටුවනු නොලැබුවා වූ ද යම් අලුත් ව්‍යවසායක් විසින් 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ අත්කර ගෙන භාවිතා කරනු ලබන අවස්ථාවක දී, ක්ෂය කිරීමේ අනුප්‍රමාණය අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක් විය යුතු ය;";

(ඇ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ දෙවන අතුරුවිධානයේ, "මෙම ඡේදයේ (i), (ii), (iii) හෝ (iv) වන අනුඡේදවල" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(i), (ii), (iii), (iv) හෝ (v) වන අනුඡේදවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ අතුරු විධානයේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ඇ) පර්යේෂණ සඳහා වන ඒ වියදම, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, යම් නවෝත්පාදනයක් වෙනුවෙන් හෝ ඉහළ වටිනාකමක් සහිත කෘෂිකාර්මික නිෂ්පාදන හා සම්බන්ධ පර්යේෂණ වෙනුවෙන් දරන ලද අවස්ථාවක දී සහ ඒ පර්යේෂණ ඒ තැනැත්තා විසින් ම හෝ ශ්‍රී ලංකාවේ යම් පර්යේෂණ ආයතනයක් හරහා සිදු කරනු ලබන අවස්ථාවක දී,";

(ඉ) ඒ උපවගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"මේ වගන්තියේ කාර්යය සඳහා, අඩු කිරීම ඒකාකාරව අදාළ කර ගැනීම සහතික කර ගැනීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.";

(ඊ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ අතුරු විධානයේ (iv) වන අනුඡේදයේ "XIVවන පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩු කිරීමේ කාර්යය සඳහා ව්‍යාපාරික නොවන කටයුත්තක් සඳහා එම වාහනය පාවිච්චි කිරීමේ ප්‍රතිලාභයේ වටිනාකම" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "මේ පනතේ XIVවන පරිච්ඡේදය යටතේ ආදායම් බදු අඩු කිරීමේ කාර්යය සඳහා ව්‍යාපාරික නොවන කටයුත්තක් සඳහා එම වාහනය පාවිච්චි කිරීමේ ප්‍රතිලාභය, මේ පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඎ) ඡේදය යටතේ නිදහස් කර නොමැති අවස්ථාවක, එම ප්‍රතිලාභයේ වටිනාකම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(උ) ඒ උපවගන්තියේ (ප) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන්:-

"(ප) 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, අදාළ තක්සේරු වර්ෂය වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු වූ සහ ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ යම් රාජ්‍ය භාගයක හෝ බිම් කුලියක මුදල, 32 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අඩු කිරීමට ඉඩ දෙනු නොලැබී නම්, ඒ රාජ්‍ය භාගය හෝ බිම් කුලිය;

(ඛ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින්, අභ්‍යාසලාභීන්ට සපයනු ලැබිය යුතු යයි ඒ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන සම්මත නිපුණතා සංවර්ධන පුහුණුවක් වෙනුවෙන් දරන ලද වියදම මෙන් සියයට තුන්සියයකට සමාන මුදලක්;

(ම) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් තැනැත්තකු විසින් නිෂ්පාදනය කරන ලද නිෂ්පාදිත අපනයනය කිරීම සඳහා වෙළඳනාම ප්‍රවර්ධනය වෙනුවෙන් දරන ලද වියදම මෙන් සියයට තුන්සියයකට සමාන මුදලක්;

මේ ඡේදයේ කාර්යය සඳහා, "වෙළඳ නාම ප්‍රවර්ධනය" යන්නෙන්, දේශීය වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයක් හෝ නිෂ්පාදිතයක් සඳහා අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන වෙළඳ නාමයක් නිර්මාණය කිරීම අදහස් වේ.";

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ අතුරු විධානයේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"මේ උපවගන්තියේ කාර්යය සඳහා "තැනැත්තා" යන්නට හවුල් ව්‍යාපාරයක් ද ඇතුළත් වේ.";

(3) ඒ වගන්තියේ 7 වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ප්‍රාග්ධන වත්කම" යන්නට දී ඇති අර්ථ නිරූපණයෙහි "යම් පිරියතක්, යන්ත්‍ර, සවිකිරීමේ උපකරණ, මෙවලම්, භාණ්ඩ හෝ උපකරණ" යන වචන වෙනුවට "පරිඝනක මෘදුකාංග හෝ කීර්තිනාමය හැර අස්පර්ශනීය වත්කම් ඇතුළුව

යම් පිරියතක්, යන්ත්‍ර, සවිකිරීමේ උපකරණ, මෙවලම්, භාණ්ඩ හෝ උපකරණ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනු ඡේදය ආදේශ කිරීමෙන්:–

"(iii) (මෙහි මින්මතු "පළමුව සඳහන් සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) සමාගමක්-

(අ) යම් පුද්ගලයකු විසින් තනිවම හෝ වෙනත් අය සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් කරගෙන යන ව්‍යාපාරයක් (ප්‍රාග්ධන වත්කම් ද ඇතුළුව) පවරා ගනු ලැබීම පිණිස සංස්ථාගත කරනු ලැබ, ඒ පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යන එම ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම් අත්කර ගනු ලැබූ අවස්ථාවක දී; හෝ

(ආ) 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත මගින් නියම කර ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය එකිනෙකින් වෙන් වූ ව්‍යාපාර ලෙස වෙන් කිරීම සඳහා හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මඟපෙන්වීම යටතේ, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට යටත්ව, යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ කල්බදු සමාගමක් බද්ධ කිරීම, අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම සඳහා සංස්ථාගත කරන ලද අවස්ථාවක සහ (මෙහි මින්මතු "දෙවනුව සඳහන් සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) ඒ එක් එක් සමාගම විසින් ඒ වෙන් කිරීම, බද්ධ කිරීම, අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීමට පෙරාතුව ඒ ව්‍යාපාර වෙන් වෙන්ව කරගෙන යනු ලැබූ අවස්ථාවක දී,

ඒ පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය හෝ දෙවනුව සඳහන් සමාගම විසින් අත්කර ගනු ලැබූ ඒ එක් එක් ප්‍රාග්ධන වත්කමේ පිරිවැයෙන්, ඒ පුද්ගලයාට, හවුල් ව්‍යාපාරයට හෝ දෙවනුව සඳහන් සමාගමට ඒ එක් එක් වත්කම සම්බන්ධයෙන් ක්ෂයවීම සඳහා ප්‍රදානය කරනු ලබන යම් දීමනා මුදලක් අඩු කළ පසු ශේෂ වන මුදල, පළමුව සඳහන් සමාගම විසින් අත්කර ගත් එක් එක් ප්‍රාග්ධන වත්කමෙහි පිරිවැය ලෙස සලකනු ලැබිය යුතු ය. තවද, ඒ පුද්ගලයා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ දෙවනුව සඳහන් සමාගම විසින් ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ දිනය පළමුව සඳහන් සමාගම විසින් ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි 1 වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (v) වන අනුඡේදයේ "එකතු කළ අගය මත බද්දක්; හෝ" යන වචන වෙනුවට "එකතු කළ අගය මත බද්දක් හෝ 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධාන ඇතුළත මූල්‍යමය සේවා මත වන ජාතිය ගොඩනැගීමේ බද්ද; හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (vii) වන අනුඡේදයේ "යම් බෝග රක්ෂණ බද්දක්," යන වචන වෙනුවට "යම් බෝග රක්ෂණ බද්දක්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(viii) 2015 අංක දරන මුදල් පනතේ විධිවිධාන යටතේ පනවා අයකර ගනු ලබන සුපිරි වාසි බද්ද, මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද, නිවාස සඳහා සෘජු චන්ද්‍රිකා සේවා අය බද්ද, චන්ද්‍රිකා ස්ථාන අය බද්ද, ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද සහ මන්දිර බද්ද;"; සහ

(2) ඒ උපවගන්තියේ (ක) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:–

"(ක) 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලපරිච්ඡේදයක් සඳහා ගෙවිය යුතු වූ ද, 2014 අප්‍රේල් මස 1 වන දිනට පසුව ගෙවනු ලැබුවා වූ ද සහ 32 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අඩු කරනු ලැබිය හැකි වූ ද යම් බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක්, නැතහොත් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ වාර්ෂිකයක්;".

**9.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය, එහි (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ, "25 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි වූ" යන වචන සහ ඉලක්කම්වල සිට "අතිරික්තය ඇතුළත් නොවේ." යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:–

"25 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි වූ ද-

(i) 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලපරිච්ඡේදයක් සඳහා ගෙවිය යුතුව තිබුණු සහ 2014 අප්‍රේල් මස 1 වන දිනට පසුව ගෙවනු ලැබූ යම් බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක් වශයෙන්; හෝ

(ii) වාර්ෂිකයක් හෝ පොලියක් වශයෙන්,

ඒ තැනැත්තා විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවනු ලබන මුදල්;

මේ ඡේදයේ කාර්යය සඳහා පොලිය යන්නට 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (බ) ඡේදයේ සහ (ම) ඡේදයේ සඳහන් අතිරික්තය ඇතුළත් නොවේ:";

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ඇඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, බද්ධ කරනු ලැබූ, අත්කර ගනු ලැබූ හෝ ඒකාබද්ධ කරනු ලැබූ යම් බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ කල්බදු සමාගමක යම් ව්‍යාපාරයක මේ පනතේ විධිවිධාන යටතේ අඩු කරනු ලැබිය හැකි යම් පාඩුවක යම් ශේෂයක් වෙතොත් එම ශේෂය සඳහා හිමිකම් පෑමට, ඒ බද්ධ කිරීම, අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීමට පෙරාතුව මේ වගන්තිය යටතේ හැකියාව තිබුණේ වී නම්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, එහෙත් (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, එම ශේෂය අදාළ බැංකුවේ, මූල්‍ය ආයතනයේ හෝ කල්බදු සමාගමේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් තවදුරටත් අඩු කරනු ලැබිය යුතු ය.".

**10.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ix) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(x) 2006 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික වකුගඩු පදනම (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ජාතික වකුගඩු අරමුදලට,";

(ආ) ඒ උපවගන්තියේ (ණ) ඡේදයේ "16ඇ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම්වල සිට "පනහකට අඩු නොවන ආයෝජනයක්:" යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද්දේ නම් 16ඇ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ බදු නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලැබිය හැකිව තිබුණා වූ යම් ව්‍යවසායක, යම් තැනැත්තකු විසින් එම ව්‍යවසාය පුළුල් කිරීමේ දී ස්ථාවර වත්කම් අත් කර ගැනීමෙහිලා 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව කරන ලද රුපියල් මිලියන පනහකට නොඅඩු ආයෝජනයක්:";

(ඇ) ඒ උපවගන්තියේ (ද) ඡේදයේ, "රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවක -" යන වචනවල සිට "වඩා අඩු මුදල් ප්‍රමාණය; සහ" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:–

"රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවක -

(i) රුපියල් ලක්ෂ පහක් ඉක්මවා ඇති එම ලාභවල කොටස; සහ

(ii) 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් ලක්ෂ එකක් හෝ 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් දෙලක්ෂ පනස් දහසක්,

යන මුදල් ප්‍රමාණවලින් අඩු මුදල් ප්‍රමාණය;";

(ඈ) ඒ උපවගන්තියේ (න) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:–

"(න) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ සහ ශ්‍රී ලංකාවේ වාසිකයකු නොවන්නා වූ යම් පුද්ගලයකුට ශ්‍රී ලංකාව තුළ උපචිත වන නිල පඩිනඩිවලින් -

(i) 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන කොටස; හෝ

(ii) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන කොටස;";

(ඉ) ඒ උපවගන්තියේ (බ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:–

"(බ) යම් බැංකුවක්, යම් මූල්‍ය සමාගමක් හෝ යම් කල්බදු සමාගමක් විසින්, වෙනත් යම් බැංකුවක්, වෙනත් යම් මූල්‍ය සමාගමක් හෝ වෙනත් යම් කල්බදු සමාගමක් අත්කර ගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ හෝ පිරිවැය වශයෙන් දරන ලද යම් වියදමක්, එකී පිරිවැය එක් එක් අවස්ථාව මත පදනම්ව, තත්කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට සියලු කරුණු සලකා බලමින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, ඒ බැංකුව, ඒ මූල්‍ය සමාගම හෝ ඒ කල්බදු සමාගම විසින් දරන ලද ඒ වියදම."; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ix) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(x) යම් තක්සේරු වර්ෂයක දී, (2) වන උපවගන්තියේ (ඛ) ඡේදයේ සඳහන් යම් බැංකුවක් හෝ සමාගමක් විසින් දරන ලද වියදම් මත සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන් වන විට දී, තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් මිලියන තුන්සියයක් යන දෙකෙන් වඩා වැඩි මුදල නොඉක්මවිය යුතු ය. ඒ තක්සේරු වර්ෂය තුළදී ම අඩු කළ නොහැකි යම් ශේෂයක් වෙතොත් එය, එම කොන්දේසිවලටම යටත්ව, ඉක්බිතිවම එළඹෙන්නා වූ තක්සේරු වර්ෂයෙන් වර්ෂයට ඉදිරියට ගෙන ගොස් ඒ ඒ තක්සේරු වර්ෂ සඳහා වන ඒ බැංකුවේ හෝ වෙනත් සමාගමේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ "ගෙවිය යුතු දළ රාජ්‍ය භාග මත" යන වචන වෙනුවට "ගෙවිය යුතු, (මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ නිදහස් කර ඇති රාජ්‍ය භාගයක් නොවන) දළ රාජ්‍ය භාග මත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** 2013 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වගන්තියේ "2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40ඇ වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම්වල සිට "ලාභය ඇතුළත් වන අවස්ථාවක දී" යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 40ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(i) 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා,

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකුගේ බදු අයකළ හැකි ආදායමට, ඒ පුද්ගලයා යම් වෘත්තිකයකු වශයෙන් කටයුතු කිරීමේ දී සේවානියුක්තියෙන් ලබන; හෝ

(ii) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට, සේවා නියුක්තියෙන් ලබන,

(මෙහි මින්මතු මේ වගන්තියේ "අදාළ ලාභය" වශයෙන් සඳහන් කරනු ලබන) ලාභය ඇතුළත් වන අවස්ථාවක දී".

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ, "යම් ව්‍යවසායකින්; හෝ" යන වචන වෙනුවට "යම් ව්‍යවසායකින්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ, "ව්‍යවසායකින්," යන වචන වෙනුවට "ව්‍යවසායකින්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) සීනි නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යවසායකින්," සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ඉ) "සීනි නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යවසාය" යන්නෙන්, උක් හෝ බීට් හෝ සම්පූර්ණයෙන් ම දේශීය ව වගා කරනු ලබන වෙනත් යම්

නිෂ්පාදිතයක් භාවිතා කරමින්, දේශීය වශයෙන් සීනි නිෂ්පාදනය කිරීම සඳහා කරගෙන යනු ලබන ව්‍යවසායක් අදහස් වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "යම් ව්‍යවසායකින්; හෝ" යන වචන වෙනුවට "යම් ව්‍යවසායකින්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "සඳහා වූ ව්‍යවසායකින්," යන වචන වෙනුවට "සඳහා වූ ව්‍යවසායකින්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"(ඈ) සීනි නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යවසායකින්,"; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ, "සංචාරක ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක්" සහ යම් "කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ හා ආදායම" සහ "ඉදිකිරීම් වැඩ සඳහා වන ව්‍යවසාය" යන යෙදුම්වලට" යන වචන වෙනුවට "සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක්", "යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම", "ඉදිකිරීම් වැඩ සඳහා වන ව්‍යවසාය" සහ "සීනි නිෂ්පාදනය කිරීම සඳහා වූ ව්‍යවසායක්" යන යෙදුම්වලට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 48ඈ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48ඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 48ඈ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:–

**"16ඈ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් සමාගමක් විසින් ආයෝජන නිර්ණායක සපුරාලීම සඳහා කාලසීමාව දීර්ඝ කිරීම.**

48ඈ. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වීම මගින් මේ පනතේ 16ඈ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ බදු නිදහස් කාලසීමාවක් භුක්ති විඳින්නා වූ යම් අලුත් ව්‍යවසායක් විසින්, ආයෝජන සම්පූර්ණ කොට වාණිජ කටයුතු ආරම්භ කළ යුතු බවට 16ඈ වගන්තියෙහි හෝ 17අ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කාලසීමාව කවරක් වුව ද, ඒ ව්‍යවසාය විසින් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඒ ගිවිසුමට ඇතුළත් වී ඇත්නම් ද, සහ ව්‍යාපාරයේ ස්වභාවය අනුව යම් ප්‍රායෝගික හේතු මත ඒ ව්‍යවසායේ ආයෝජනය කළ සමාගමට ඒ ව්‍යවසායේ නියමිත ආයෝජන 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සම්පූර්ණ කිරීමට හා 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වාණිජ කටයුතු ආරම්භ කිරීමට නොහැකි නම් ද, ඒ අලුත් ව්‍යවසාය විසින් නිරතව සිටින ක්‍රියාකාරකම්වල ස්වභාවය , 16ඈ වගන්තිය හෝ 17අ වගන්තිය යටතේ සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් පමණක් වන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන්නේ නම් හා ආයෝජකයා විසින් කරන ලද ඉල්ලීමක් මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ඒ අලුත් ව්‍යවසායේ ප්‍රගතිය පිළිබඳව පරීක්ෂා කොට එකී කාලය දීර්ඝ කිරීම සඳහා වන හේතු යුක්ති සහගත හා පිළිගත හැකි හේතු බවට සනාථ කරන්නේ නම්, ඒ කාලසීමාව 2017 අප්‍රේල් මස 1 වන දින දක්වා දීර්ඝ කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 56ඈ වගන්තිය සංශෝධනය කිරීම.**

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56ඈ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ "දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද නිමි ඇඳුම්, රෙදිවලින් සාදන ලද මලු, ලිනන්, තිර රෙදි හෝ වෙනත් යම් භාණ්ඩයක්" යන වචන වෙනුවට "දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද නිමි ඇඳුම්, රෙදිවලින් සාදන ලද මලු, ලිනන්, තිර රෙදි, ඇසුරුම් ද්‍රව්‍ය හෝ සෙරමික් නිෂ්පාදන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ අතුරු විධානයේ "ඒ නිමි ඇඳුම්වල, මලුවල, ලිනන්වල, තිර රෙදිවල හෝ වෙනත් භාණ්ඩවල දේශීය වටිනාකම එකතු කිරීම" යන වචන වෙනුවට "ඒ නිමි ඇඳුම්වල, මලුවල, ලිනන්වල, තිර රෙදිවල, ඇසුරුම් ද්‍රව්‍යවල හෝ සෙරමික් නිෂ්පාදනවල දේශීය වටිනාකම එකතු කිරීම" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**18.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ "නැව් මෙහෙයවන්නකුගේ නියෝජිතයකු විසින්" යන වචනවල සිට "ඒ අපනයනකරු විසින් හෝ විදේශීය ප්‍රධානියා විසින්" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:–

"(i) ඍජුවම හෝ යම් අපනයන වෙළඳ මධ්‍යස්ථානයක් හරහා භාණ්ඩ හා සේවා අපනයනය කරනු ලබන යම් අපනයනකරුවකු වෙත, නැතහොත් ඍජුවම ඒ අපනයනකරුගේ විදේශීය ප්‍රධානියකු වෙත, ඒ අපනයනය කරනු ලබන භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම සමඟ අත්‍යවශ්‍යයෙන් ම සම්බන්ධ වන බවට සලකනු ලැබිය හැකි යම් සේවාවන් සැපයීමෙන්;

(ii) නැව් මෙහෙයවන්නකුගේ නියෝජිතයකු විසින් ඒ නියෝජිතයාගේ විදේශීය ප්‍රධානියා වෙත යම් සේවාවන් සැපයීමෙන්; හෝ

(iii) යම් භාණ්ඩ මෙහෙයුම්කරුවකු විසින් සපයනු ලබන සේවාවන් භාණ්ඩ අපනයනය කිරීම සඳහා වන තාක් දුරට, ඒ භාණ්ඩ මෙහෙයුම්කරු විසින් යම් සේවාවන් සැපයීමෙන්,

ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකුට, එකී සේවාවන් සඳහා ඒ අපනයනකරු විසින් හෝ විදේශීය ප්‍රධානියා විසින් හෝ භාණ්ඩ මෙහෙයුම්කරුගේ සේවාලාභියා විසින්"; සහ

(2) ඒ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"මේ වගන්තියේ කාර්යය සඳහා "භාණ්ඩ මෙහෙයුම්කරු" යන්නෙන්, විනිමය පාලන පනත යටතේ "භාණ්ඩ මෙහෙයුම්කරුවකු" වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලියාපදිංචි වී ඇති-

(i) භාණ්ඩ මෙහෙයුම්කරුවන්ගේ "සියලු අවදානම් සහ නෛතික බැඳීම් රක්ෂණ ආවරණය" මගින් ආවරණය වන භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ බහුවිධ ලියකියවිලි නිකුත් කරන; සහ

(ii) යම් කාර්තුවක් සඳහා අදාළ වන පිරිවැටුමේ වාර්තාව සමඟ,විනිමය පාලන පනතේ 29ආ වගන්තිය යටතේ විනිමය පාලකවරයා විසින් නිකුත් කරන ලද නිවේදනයෙහි තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට අදාළ කාර්තුවක් සමන්විත වන එක් එක් මාසය සම්බන්ධයෙන් විනිමය පාලකවරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශනවල පිටපත් සහ ඒ නිවේදනයෙහි හතරවන, පස්වන සහ හයවන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කරන ලද ශුද්ධ ආදායම් ප්‍රකාශ ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන පන්සියයක් නො ඉක්මවන," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට

පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන පන්සියයක් නො ඉක්මවන;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:–

"(iii) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන හත්සිය පනහක් නො ඉක්මවන,".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඊ වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 59ඊ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකුගේ 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන බදු අය කළ හැකි ආදායමට, (මෙහි මින්මතු මේ වගන්තියේ "අදාළ ලාභ" යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තිකයකු වශයෙන් වෘත්තීමය සේවා සැපයීමෙන් උපයනු ලබන යම් ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක සහ (මෙහි මින්මතු මේ වගන්තියේ "බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ බදු අය කළ හැකි ආදායමේ කොටසක් මත මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ ගෙවිය යුතු වන ආදායම් බදු අනුප්‍රමාණය සියයට දොළහක් ඉක්මවන අවස්ථාවක, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස සඳහා ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබිය යුතු ය:–

(අ) බදු අය කළ හැකි ආදායමේ ඒ අදාළ කොටස, අදාළ ලාභ ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක, බදු අය කළ හැකි ආදායමේ ඒ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබිය යුතු ය:–

(i) ඒ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් නොඉක්මවයි නම්, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ අදාළ ලාභ හා සමාන වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය අනුව විය යුතු අතර, බදු කළ හැකි ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ සියයට දොළහකට වැඩි අනුප්‍රමාණ අතුරින් ඊට අදාළ වන අනුප්‍රමාණ අනුව ගණනය කරනු ලැබිය යුතු ය; හෝ

(ii) ඒ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් ඉක්මවයි නම් හා එහෙත් රුපියල් මිලියන තිස්පහක් නොඉක්මවයි නම්, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ රුපියල් මිලියන විසිපහකට සමාන වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය අනුව විය යුතු අතර, ඒ අදාළ ලාභයේ රුපියල් මිලියන විසිපහක් ඉක්මවන අතිරික්තය මත ගෙවිය යුතු බද්ද සියයට දහහතරක අනුප්‍රමාණය අනුව විය යුතු ය. තවද, බදු අයකළ හැකි ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ සියයට දොළහකට වැඩි අනුප්‍රමාණ අතුරින් ඊට අදාළ වන අනුප්‍රමාණ අනුව ගණනය කරනු ලැබිය යුතු ය; හෝ

(iii) ඒ අදාළ ලාභය රුපියල් මිලියන තිස්පහක් ඉක්මවයි නම්, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ රුපියල් මිලියන විසිපහකට සමාන වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය අනුව ද, රුපියල් මිලියන දහයකට සමාන වන කොටස මත ගෙවිය යුතු බද්ද සියයට දහහතරක අනුප්‍රමාණය අනුව ද විය යුතු අතර, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබිය යුතු ය:–

(අ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ එම ශේෂයේ කොටසක් මත මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට දහසයක් ඉක්මවන අවස්ථාවක:

– අදාළ ලාභයේ, රුපියල් මිලියන තිස්පහක් ඉක්මවා ඇති අතිරික්තය නොඉක්මවන බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද සියයට දහසයක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය; සහ

– බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ යම් ශේෂයක් මත ගෙවිය යුතු බද්ද මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ සියයට දහසයකට වැඩි අනුප්‍රමාණ අතුරින් ඊට අදාළ වන අනුප්‍රමාණ අනුව ගණනය කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ එම ශේෂයේ යම් කොටසක් මත මේ පනතේ පළමුවන උපලේඛනය යටතේ බදු ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය සියයට දහසයක් නොඉක්මවන අවස්ථාවක, ඒ සමස්ත ශේෂය මත ගෙවිය යුතු බද්ද සියයට දහසයක අනුප්‍රමාණය අනුව ගණනය කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) බදු අය කළ හැකි ආදායමේ ඒ අදාළ කොටස අදාළ ලාභ නොඉක්මවන අවස්ථාවක, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටස මත ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන පරිදි ගණනය කරනු ලැබිය යුතු ය:–

(i) ඒ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන්නේ නම්, බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ සමස්තය මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය; හෝ

(ii) ඒ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් ඉක්මවයි නම්,

බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ අදාළ ලාභ රුපියල් මිලියන විසිපහක් ඉක්මවන අතිරික්තය මත ගෙවිය යුතු බද්ද සියයට දොළහක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය;

බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ රුපියල් මිලියන දහයක් දක්වා වන යම් අතිරික්තයක් මත ගෙවිය යුතු බද්ද සියයට දහහතරක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය; සහ

බදු අය කළ හැකි ආදායමේ අදාළ කොටසේ යම් ශේෂයක් මත ගෙවිය යුතු බද්ද සියයට දහසයක අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබිය යුතු ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59උඋ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ඒ ප්‍රඥප්තියේ 59එ, 59ඒ, 59ඔ, 59ඕ සහ 59ක වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:–

ප්‍රධාන ප්‍රඥප්තියට 59එ,59ඒ,59ඔ 59ඕ, සහ 59ක යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"බස්නාහිර පළාත හැර වෙනත් යම් පළාතකට තම ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීමේ යෙදී සිටින යම් නිෂ්පාදන සමාගමක ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය.

59එ. (මත්පැන් හෝ දුම්කොළ හැර වෙනත්) නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ ද, මේ පනතේ දෙවන උපලේඛනයේ ආ කොටසේ 3 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත ආදායම් බදු ගෙවීමට යටත් වන්නා වූ ද දැනට පවත්නා සමාගමක් විසින්, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2017 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් මිලියන තුන්සියයකට නොඅඩු (ඉඩම් හා ගොඩනැගිලි හැර) ස්ථාවර වත්කම් අත්කර ගැනීමෙහිලා ආයෝජනය කිරීම මගින් (දැනට පවත්නා සමාගම හෝ එහි කොටසක් හෝ වෙනත් ස්ථානයකට රැගෙන යාමක් නොවන) බස්නාහිර පළාත හැර වෙනත් යම් පළාතකට ඒ සමාගමේ ඒ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ දී ඒ ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියේ වාණිජ කටයුතු ආරම්භ කරන ලද තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තවත් තක්සේරු වර්ෂ හතරක කාලයක් සඳහා ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය රුපියල් මිලියන පන්සියයක් නො ඉක්මවන උපරිම මුදලක් දක්වා සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

යම් නිෂ්පාදන ව්‍යාපාරයක නිරතව සිටින අලුත් සමාගමක ලාභ සහ ආදායම සඳහා අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය.

59ඒ. කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන්නා වූ යම් නිශ්චිත කාලසීමාවක් ඇතුළත, දැනට පවත්නා ඕනෑම ස්වභාවයක ව්‍යවසායක් කැඩීමෙන් හෝ ප්‍රතිනිර්මාණය කිරීමෙන් පිහිටුවනු නොලැබුවා වූ (මත්පැන් හෝ දුම්කොළ පදනම් කරගත් නිෂ්පාදන නොවන වෙනත්) යම් නිෂ්පාදන ව්‍යාපාරයක රුපියල් මිලියන පන්සියයකට වැඩි මුදලක ගිවිසුම්ගත ආයෝජනයක් සහිතව, 2015 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර ආදායම් බදු කාර්ය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි වී ඇත්තා වූ යම් සමාගමක ලාභ සහ අදායම මත අදාළ වන අදායම් බදු අනුප්‍රමාණය සියයට විසි අටක් නම්, ඒ සමාගම වාණිජ කටයුතු ආරම්භ කරනු ලබන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට

ඉක්බිතිව ම එළඹෙන අනුගාමී තක්සේරු වර්ෂ හයක් සඳහා එකී සමාගමේ ලාභ සහ ආදායම මත අදාළ වන ආදායම් බදු අනුප්‍රමාණය සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

**1970 සිට ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින දේශීය නිෂ්පාදකයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද.**

59ඔ. ආනයන සමග තරගකාරීත්වයට මුහුණ දෙමින් එක්දහස් නවසිය හැත්තෑව වර්ෂයේ සිට නිෂ්පාදන ව්‍යාපාරයක නිරතව සිටින යම් නිෂ්පාදකයකු විසින්, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනතට අනුකූලව ගෙවිය යුතු යයි ගණන් බලනු ලබන අදායම් බද්දේ කොටස, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, (මත්පැන් හෝ දුම්කොළ පදනම් කරගත් නිෂ්පාදිත නොවන) ඒ නිෂ්පාදිත දේශීය වෙළඳ පොළේ විකිණීමෙන් ලැබෙන සියයට විසි අටක උපරිම බදු අනුප්‍රමාණයකට යටත් වන්නා වූ ලාභ සහ ආදයම මත, සියයට දහයකින් අඩු කරනු ලැබිය යුතු ය.

**අතුරු බෝග වගා කටයුතුවල හෝ එළවළු සහ ආහාර පිරිසැකසුම් කිරීමේ කටයුතුවල නිරතව සිටින දේශීය ව්‍යවසායකයන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද.**

59ඕ. අතුරු බෝග වගා කටයුතුවල හෝ එළවළු සහ ආහාර පිරිසැකසුම් කිරීමේ කටයුතුවල නිරතව සිටින යම් දේශීය ව්‍යවසායකයකු විසින්, 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනතට අනුකූලව ගෙවිය යුතු යයි ගණන් බලනු ලබන අදායම් බද්දේ කොටස, ඒ කටයුතුවලින් ලැබෙන ලාභ සහ ආදායම මත සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා -

"දේශීය ව්‍යවසායකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු අදහස් වන අතර, ඊට ශ්‍රී ලාංකිකයන් විසින් පාලන අයිතිය දරන සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් ද ඇතුළත් වේ;

"අතුරු බෝග වගා කටයුතු" යන්නෙන් එකම ඉඩමක එකවර බෝග වර්ග දෙකක් හෝ ඊට වැඩි ගණනක් වගා කිරීම අදහස් වේ;

"එළවළු සහ ආහාර පිරිසැකසුම් කිරීමේ කටයුතු" යන්නෙන්, සියයට තිස්පහකට නොඅඩු දේශීය අගය එකතු කිරීමක් සහිතව සහ අවසාන නිෂ්පාදිතය සියයට හැත්තෑවකට නොඅඩු දේශීය වශයෙන් වගා කරන ලද එළවළුවලින් හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද ආහාරවලින් සමන්විත වන පරිද්දෙන් යම් තැනැත්තකු විසින් එළවළු සහ ආහාර පිරිසැකසුම් කිරීම අදහස් වේ.

යම් පසුගාමී කලාපයක පිහිටා ඇති ව්‍යවසායක් මත යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද.

59ක. යම් පසුගාමී කලාපයක පිහිටි, නිෂ්පාදන කටයුතු සඳහා හෝ සේවා සැපයීම සඳහා වන යම් ව්‍යවසායක 2015 පෙබරවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2017 මාර්තු මස 31 වන දිනට පෙරාතුව රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු මුදලක් ආයෝජනය කරන නිෂ්පාදකයකු හෝ සේවා සපයන්නකු වන යම් තැනැත්තකු විසින් මේ පනතට අනුකූලව ගෙවිය යුතු යයි ගණන් බලනු ලබන ආදායම් බද්දේ කොටස, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, එම ව්‍යවසාය විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලබන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ තවත් තක්සේරු වර්ෂ හතරක් සඳහා ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායම මත සියයට පනහකින් අඩු කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා යම් තක්සේරු වර්ෂයකට අදාළව "පසුගාමී කලාපය" යන්නෙන්, යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් පිහිටියේ යම් අදාළ බලධරයකුගේ බල ප්‍රදේශය තුළ ද, ඒ බලධරයා විමසා සහ අමාත්‍යවරයාගේ අනුමතය සහිතව, කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් ආර්ථික වශයෙන් පසුගාමී තත්වයක පවතින ප්‍රදේශයක් බවට නිශ්චිතව දක්වනු ලබන යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ, "එම සමාගම විසින් එම තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ දී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ පළමුවන අතුරු විධානයේ (උඉ) ඡේදයේ සඳහන් සමාගමක් නොවන එම සමාගම විසින් එම තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය, එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"මේ වගන්තියේ කාර්යය සඳහා, "මේ පනතේ 3(අ) වගන්තිය යටතේ වන ලාභවල කොටසක් සංයුක්ත වන්නා වූ ලාභාංශවලින් ලබන ලාභ සහ ආදායම" යන්නෙන්, ලාභාංශ ලැබීමේ ඒ ව්‍යාපාරයෙන් ලබන ලාභ නිශ්චය කිරීමේ දී, වියදම් අඩු කිරීමෙන් පසු ලාභ සහ ආදායම අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ "රාජ්‍ය භාග" යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වචන වෙනුවට "රාජ්‍ය භාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "32 වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "25 වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:–

"මේ වගන්තියේ කාර්යය සඳහා "තාක්ෂණික සේවා සඳහා ගාස්තු" යන්නෙන්, ස්ථාවර පදනමක් තුළින් ඉටු කරනු ලබන සේවා නියුක්ති හෝ වෘත්තීමය සේවාවන් හැර, තාක්ෂණික හෝ වෙනත් පුද්ගලයන් විසින් සපයනු ලබන සේවාවන් ද ඇතුළත්ව, කළමනාකාරීත්ව හෝ තාක්ෂණික හෝ උපදේශක සේවාවන් සඳහා ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන ඕනෑම ආකාරයක ගෙවීමක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "කුලියක්, බිම් කුලියක්, රාජ්‍ය භාගයක්" යන වචන වෙනුවට "කුලියක්, බිම් කුලියක්, තාක්ෂණික සේවා සඳහා ගාස්තු ද ඇතුළත්ව රාජ්‍ය භාගයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ අතුරු විධානයේ (අඅඅ) ඡේදයේ "අඩු කිරීමක් නොකළ යුතු ය; සහ" යන වචන වෙනුවට "අඩු කිරීමක් නොකළ යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ "ඉහතින් වූ විධිවිධාන අදාල නොවිය යුතු ය." යන වචන වෙනුවට "ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය; සහ " යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක තැන්පත් කරන ලද මුදල් මත යම් පුද්ගලයකුට ගෙවනු ලබන සහ මේ පනතේ 133 වන වගන්තියෙහි සඳහන් සියයට දෙක හමාරක අනුප්‍රමාණයකට ආදායම් බදු අඩු

සියයට 12



කරනු ලැබිය හැකි පොලියෙන් මේ වගන්තිය යටතේ කිසිදු අඩු කිරීමක් නොකළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 105ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 105අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 105ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:–

“ඉලෙක්ට්‍රොනික සන්නිවේදන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීම.

105ආ. (1) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීමට බලය දීමේ හෝ පහසුකම් සැලසීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) වාර්තා ගොනු කිරීමේ දී සහ තොරතුරු හා ලේඛන ඉදිරිපත් කිරීමේ දී ඉලෙක්ට්‍රොනික ක්‍රම අදාළ කර ගැනීමේ කාර්යය සඳහා මේ පනතේ අදාළ වගන්ති පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලබන අතර, ඒ සංශෝධන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක බලාත්මක විය යුතු ය.

(අ) 28 (4), 36 (2) (ආ), 70 (1), 73 (1), 76 (3), 95 (2), 104 (2), 104අ (2), 111, 112, 118, 119, 122, 125 (1), 130, 133, 162, 163, 165 සහ 177 යන වගන්තිවල “ලියවිල්ලකින්”, “ලිඛිතව” හෝ “ලිඛිත” යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට, පිළිවෙළින් “ලියවිල්ලකින් හෝ විද්‍යුත් ක්‍රමයකින්”, “ලිඛිතව හෝ විද්‍යුත් ක්‍රමයකින්” හෝ “ලිඛිත හෝ විද්‍යුත් ක්‍රමයකින් වූ” යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 106 සහ 107 යන වගන්තිවල කාර්ය සඳහා වාර්තා ගොනු කිරීමට, දැන්වීම් නිකුත් කිරීමට, තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කිරීමට අදාළව ඒ වගන්තිවල “ලියවිල්ලකින්” හෝ “ලිඛිත” යන

වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක, ඒ වෙනුවට පිළිවෙලින් "ලියවිල්ලකින් හෝ විද්‍යුත් ක්‍රමයකින්" හෝ "ලිඛිත හෝ විද්‍යුත් ක්‍රමයකින් වූ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 107 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ "ගැසට් පත්‍රයේ කොමසාරිස් ජනරාල්වරයා විසින්" හෝ "කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ" යන වචන වෙනුවට පිළිවෙලින් "ගැසට් පත්‍රයේ හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ කොමසාරිස් ජනරාල්වරයා විසින්" හෝ "කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ඇ) ඡේදයෙහි "සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩු කර ගෙන තිබෙන විටක." යන වචන වෙනුවට "අඩු කිරීමේ කාර්යය සඳහා නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය අනුව ආදායම් බදු අඩු කර තිබෙන විටක." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ (අඅ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(අඅ) "අනුමත ගණකාධිකාරීවරයා" යන්නෙන්, 2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරීවරයෙක්; හෝ

(ii) වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන පන්සියයක් නොඉක්මවන්නාවූ ද, තම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලින් සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අදාළ කර ගැනීම අනිවාර්ය නොවන්නාවූ ද ආයතනයක් සම්බන්ධයෙන් වන විට, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරීවරයෙක්,

අදහස් වේ;".

**29.** 2012 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(i) (අ) 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් වර්ෂයක් සඳහා මසකට රුපියල් පනස් දහසකට හෝ වර්ෂයකට රුපියල් හය ලක්ෂයකට වැඩියෙන් පාරිශ්‍රමිකයක් ලබන; හෝ

(ආ) 2015 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන යම් වර්ෂයක් සඳහා මසකට රුපියල් හැට දෙදහස් පන්සියයකට හෝ වර්ෂයකට රුපියල් හත් ලක්ෂ පනස් දහසකට වැඩියෙන් පාරිශ්‍රමිකයක් ලබන;".

**30.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය, එහි (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "අනුප්‍රමාණයක් අනුව විය යුතු ය; සහ" යන වචන වෙනුවට "අනුප්‍රමාණයක් අනුව විය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "යම් පුණ්‍ය ආයතනයක්" යන වචන වෙනුවට "2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් පුණ්‍ය ආයතනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ අවසානයට පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන් ඃ-

"(iii) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් හවුල් ව්‍යාපාරයක්, පුණ්‍ය ආයතනයක් හෝ යම් පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට දී, අඩු කළ යුතු මුදල එම පොලියෙන් සියයට දෙක හමාරක අනුප්‍රමාණයක් අනුව විය යුතු ය; සහ

(iv) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට දී, අඩු කළ යුතු මුදල එම පොලියෙන් සියයට අටක අනුප්‍රමාණයක් අනුව විය යුතු ය;";

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "යම් තක්සේරු වර්ෂයකට අදාළව, එම තක්සේරු වර්ෂය සඳහා එහි තක්සේරු කළ හැකි ආදායමඃ-" යන වචන වෙනුවට "2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයකට අදාළව, එහි තක්සේරු කළ හැකි ආදායමඃ-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "එම පුද්ගලයා විසින් යම් තක්සේරු වර්ෂයකට අදාළව" යන වචන වෙනුවට "එම පුද්ගලයා විසින් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයකට අදාළව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "අඩු කිරීම සිදු කළ යුත්තේ එම පොලී මුදලින් සියයට අටක අනුප්‍රමාණයකට විය යුතුයඃ" යන වචන වෙනුවට "2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අඩු කිරීම සිදු කළ යුත්තේ එම පොලී මුදලින් සියයට අටක අනුප්‍රමාණයකට විය යුතු යඃ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(4) අවස්ථාවෝචිත පරිදි, වෙන් කිරීමට පෙරාතුව යම් රක්ෂණ ව්‍යාපාරයක් විසින් හෝ අත්කර ගනු ලැබූ, බද්ධ කරනු ලැබූ හෝ ඒකාබද්ධ කරනු ලැබූ යම් බැංකුවක්, මුල්‍ය ආයතනයක් හෝ කල්බදු සමාගමක් විසින් හිමිකම් පෑමට අයිතිය ඇති මතිමාත්‍ර බදු බැරකමක යම් ඉතිරි මුදලක්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, (රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට) ඒ වෙන් කිරීම සිදු නොවූයේ නම් හෝ ඒ බැංකුව, මුල්‍ය ආයතනය හෝ කල්බදු සමාගම සම්බන්ධයෙන් වන විට ඒ අත්කර ගැනීම හෝ බද්ධ කිරීම හෝ ඒකාබද්ධ කිරීම සිදු නොවූයේ නම් කොන්දේසිවලට යටත්ව හිමිකම් පෑමට හැකියාව තිබුණේ වී නම්, කොන්දේසිවලට යටත්ව ඉඩදිය හැකි අඩු කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** 2007 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(1) (අ) 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 133 වන වගන්තියේ හෝ 135 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැංකුවක් හෝ මුල්‍ය ආයතනයක් හෝ යම් සාංගමික ණය සුරැකුම්පත් නිකුත්කරන සමාගමක් විසින් යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක පොලී ආදායමෙන් ආදායම් බදු අඩුකර ගනු ලබන්නා වූ ද, ඒ පොලී ආදායම, යම් තක්සේරු වර්ෂයක් සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ හෝ ඒ හවුල් ව්‍යාපාරයේ බෙදාදිය හැකි ලාභයේ හෝ ආදායමේ කොටසක් වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා හෝ අදාළ හවුල්කරුවන් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද, ඒ තක්සේරු වර්ෂය තුළ 133 වන වගන්තිය හෝ 135 වන

වගන්තිය යටතේ අඩුකරනු ලැබිය යුතු අදායම් බද්දට වඩා අඩු වන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අඩුකිරීමේ දී අවශ්‍ය වෙනස්කම් සිදුකරන ලෙසට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය හෝ සාංගමික ණය සුරැකුම්පත් නිකුත් කරන සමාගම වෙත දැනුම් දෙමින් විධානයක් නිකුත් කරන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘතියක සහ ඔහු විසින් නිශ්චිතව දක්වනු ලබන විස්තර ඇතුළත් ඉල්ලීමක්, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය; සහ

(ආ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 133 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් (පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් නොවන) යම් තැනැත්තකුගේ පොලී ආදායමෙන් ආදායම් බදු අඩුකර ගනු ලබන්නා වූ ද, ඒ පොලී ආදායම යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ කොටසක් වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද ඒ තක්සේරු වර්ෂය තුළ 133 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබිය යුතු ආදායම් බද්දට වඩා අඩු වන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා අදායම් බදු අඩු කිරීමේ දී අවශ්‍ය වෙනස්කම් සිදුකරන ලෙසට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත දැනුම් දෙමින් විධානයක් නිකුත්කරන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘතියක සහ ඔහු විසින් නිශ්චිතව දක්වනු ලබන විස්තර ඇතුළත් ඉල්ලීමක්, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකිය. ".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "ඒ අඩුකිරීම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් තොරතුරක් ඇතුළත් කරමින් මසකට වරක් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඒ අඩුකිරීම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින්- ප්‍රධාන ප්‍රඥප්තියේ 150 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මාසික පදනම මත; සහ

(ආ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා කාර්තු පදනම මත,

වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "ඒ ක්‍රියාකාරකම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින් මාසික පදනම මත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඒ ක්‍රියාකාරකම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින්-

(අ) 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මාසික පදනම මත; සහ

(ආ) 2015 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා කාර්තු පදනම මත,

වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

"එසේ වුවද, යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(i) යම් තැනැත්තකු විසින් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදාළ යම් හිඟ මුදල් ඒ තැනැත්තා විසින් ලබා ගැනීමට;

(ii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාළ කර ගැනීමට සමගාමීව, ඒ අදාළ කර ගැනීම සිදු වූ තක්සේරු වර්ෂය සඳහා කරන ලද යම් ගැළපීමකට; හෝ

(iii)(අ) යම් තැනැත්තකුගේ 104 වන වගන්තියේ සඳහන් ලාභ සහ ආදායම හෝ පාඩුව, අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර නැති බවට සහ ඒ තක්සේරුව නිකුත් කිරීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඒ තැනැත්තා වාසික රටේ ආණ්ඩුව අතර ද්විත්ව බදුකරණය වෙනුවෙන් සහන ලබා දීම සඳහා බලාත්මකව පවතින යම් ගිවිසුමක යම් විධිවිධානයකට පටහැනි නොවන බවට; හෝ

(ආ) යම් තැනැත්තකුගේ 104අ වගන්තියේ සඳහන් ලාභ සහ ආදායම හෝ පාඩුව අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තීරණය කර නැති බවට,

කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ වාර්තාව ලැබීමේ දින සිට අවුරුදු පහක කාලයක් ඉකුත් වීමට පෙර යම් කාලපරිච්ඡේදයක් තුළ, 2013 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අවස්ථාවෝචිත පරිදි, 104 වන වගන්තියේ හෝ 104අ වන වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලබන යම් ලාභයකට සහ ආදායමට හෝ පාඩුවකට,

ආනුෂංගිකව ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්ද තක්සේරු කිරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "ලාභ සහ ආදායම ගණනය කරන ආකාරය." යන වචන වෙනුවට "ලාභ සහ ආදායම ගණනය කරන ආකාරය;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් ඃ-

"(ඊ) මේ පනතේ කාර්යය සඳහා සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන වෙනත් පනත්වල කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි, යම් බැංකුවක්, මූල්‍ය ආයතනයක් හෝ කල්බදු සමාගමක් අත්කර ගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැයට අදාළ සුදුසුකම් ලැබීමේ ගෙවීම ගණනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සහ බදු මධ්‍යස්ථ තත්වය දිගටම පවත්වා ගැනීම සඳහා වූ මාර්ගෝපදේශ;

(උ) අවශ්‍ය පරිදි කලින් කල කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන පනත් සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය සහ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා වන රීති සහ මාර්ගෝපදේශ.".

**37.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ අ කොටසේ (3) වන අයිතමයේ "යම් ඒකක භාර කළමනාකරණ සමාගමක බදු අය කළ හැකි ආදායම මත-" යන වචන වෙනුවට "යම් ඒකක භාර කළමනාකරණ සමාගමකට යම් ඒකක භාරයක් කළමනාකරණය කිරීමෙන් ලැබෙන බදු අය කළ හැකි ආදායම මත-" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ ආ කොටසේ (1) (ඇ) අයිතමයේ "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින සමාගමක් නොවන-" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ ආ කොටසේ (ඇ) අයිතමයේ -

"2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2014 අප්‍රේල් මස 1 දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින සමාගමක් වන-" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2014 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා-

යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින සමාගමක් නොවන යම් සමාගමක් වන-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**38.** 2014 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය, එහි 46 වන අයිතමය ඉවත් කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

වලංගු කිරීම.

**39.** මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාරව, 2015 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව, මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරන ලද දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන්, යම් තැනැත්තකුගෙන් අය කරන ලද හෝ එකතු කරන ලද යම් බදු මුදලක් කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් ඒ බද්ද අය කරන ලද හෝ එකතු කරන ලද ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ සියලු කාර්ය සඳහා වලංගු ලෙස හා නීත්‍යානුකූල ලෙස අය කරනු ලැබූ හෝ එකතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඉහත කී විධිවිධානය, ඒ කාලසීමාව තුළ දී අය කරන ලද හෝ එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් දෙන ලද යම් තීරණයකට හෝ කරන ලද යම් ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය.

**40.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.